# MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

## G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පොෂ.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

## SINHALA

සිංහල

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

## අධ්‍යාපන අමාත්‍යාංශය

**සිංහල භාෂාව හා සාහිත්‍යය - I**

**අ.පොෂ. (සා/ පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 1 යි**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු පසයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

- අංක 1-3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

1. රාත්‍රිය පුරා ඇදහැළුණු **අනෝරා වැස්ස** නිසා ජීවිත දෙකක් අහිමි විය .
   1. මද වැස්ස
   2. වාරකන් වැස්ස
   3. නැවතීමක් නොමැති
   4. තද වැස්ස

2. **අහස් මාලිගා තැනීම** කෙනෙකුගේ ඉදිරි ගමනට බාධාවකි .
   1. අනාගත බලාපොරොත්තු තබා ගැනීම.
   2. තමන්ට නොලැබෙන දේ ගැන සිතින් මවා ගැනීම.
   3. ඉදිරියට සැලසුම් කිරීම.
   4. මාලිගාවක් තැනීමට සූදානම් වීම.

3. නිලධාරින්ගේ ඉවක් බවක් නොමැති **ඇඟිලි ගැසීම්** නිසා සේවකයන් අප්‍රසාදයට පත්ව ඇත.
   1. අවිචාරාත්මකව
   2. ඒක පාර්ශ්විකව
   3. අත්තනෝමතිකව
   4. අනපේක්ෂිතව

4 සිට 6 තෙත් ඇති ප්‍රශ්නවලට හිස්තැනට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.

4. ත්‍රස්තවාදයෙන් තම දේශය ගලවා ගැනීමට රජය දරන _____ ජනතා සහයයෝගය අවශ්‍ය වේ.
   1. ප්‍රවාහයට
   2. ප්‍රහාරයට
   3. ප්‍රදානයට
   4. ප්‍රයත්නයට

5. මහනුවර යුගයේ බිතු සිතුවම්වල ලක්ෂණ බව විද්වත්හු කියති.
   1. ආවේණික
   2. ආකස්මික
   3. ආස්වාදනීය
   4. ආගන්තුක

6. පද්‍ය නිර්මාණයක සාර්ථකත්වයට කවියාගේ _____ බලපායි.
   1. පරිහරණය
   2. පරිශීලනය
   3. පරිකල්පනය
   4. පරිභාෂණය

7. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි පද පේළිය තෝරන්න .

1. යාපනය, කෝට්ටේ, සෙංකඩගල, කුරුණෑගල
2. කුරුණෑගල, ගාල්ල, පොළොන්නරුව, මඩකලපුව
3. ගම්පල, රත්නපුර, ඇහැලියගොඩ, කලවාන
4. මහනුවර, දඹාන, හම්බන්තොට, හලාවත

8. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. විමර්ශන, ශුෂ්ක, උත්කෘෂ්ට, සමස්ත
2. ශිෂ්ය, පිළිවෙල, අභිධර්ම, ප්‍රභාස්වර
3. අභිෂේක, නිළුපුල් , කනිෂ්ය, පුස්තකාලය
4. සමණය, විවරණය, පින්සෙණ්ඩු, තෘෂ්ණාව

9. එක් එක් වචනයේ පාපිල්ල, රකාරාංශය, රේඵය, දීර්ඝ ඇදය පිළිවෙළින් ඇති පද පේළිය තෝරන්න.

1. කමීය, භ්‍රමණය, කුස තණ, පෑළ දොර
2. පුරුදු, ධ්‍රැවය, මර්දනය, කෑරගල
3. රැවල, භ්‍රමණය, ස්වණීපාලී, දෑගසව්
4. තුවාලය, දුෂ්ට, ධමීය, වැස්ස

10. ‘‘සියපත්’’ යන වචනය අයත් වනුයේ

1. විශේෂණ සමාස
2. අන්‍යාර්ථ සමාස
3. අව්‍ය සමාස
4. විභක්ති සමාස

11. විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඩල මෙහි ‘‘රිවි’’ යන්න,

1. රූපාකාලංකාරයකි
2. උපමාලංකාරයකි
3. විශේෂණ පදයකි
4. ප්‍රත්‍යයකි.

12. ‘‘හැඬිණි’’ යන පදයේ ‘‘හඬ’’ යන්න

1. ධාතු ප්‍රකෘතියයි
2. නාම ප්‍රකෘතියයි
3. විශේෂණ පදයයි
4. ප්‍රත්‍යයයි

13. වැසි <u>සමේ</u> තුරුලතා ජීවය ලබයි.
මෙහි ‘‘සමේ’’ යන්න ,

1. අවධි විභක්ති පදයයි
2. කර්ම විභක්ති පදයයි
3. සම්බන්ධ විභක්ති පදයයි.
4. ආධාර විභක්ති පදයයි.

14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

14. මනා වූ පද **සුසංයෝජනය** පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට බලපායි.
1. විරිත රැකුණු
2. එළිසමය රැකුණු
3. මැනවින් සංයෝජනය වූ
4. නිවැරදි පද පිළිවෙළක් ඇති

15. මේ **අඛණ්ඩ** ව්‍යායාමය විභාග සමර්ථ්‍යය පිණිසයි
1. ස්ථාවර
2. අවුලින් තොර
3. නො බිඳුණු
4. ප්‍රයෝග

16. වෛද්‍යවරයා **සර්වාංගයම** පරීක්ෂා කළේ ය.
1. අස්ථි කොටස
2. සියලු රෝග
3. ශරීර අභ්‍යන්තරය
4. සියලු ශරීරය

17. පහත සඳහන් පද අයත් වන ව්‍යාකරණ ප්‍රවර්ගය කුමක් ද?
1. තද්ධිත
2. ක්‍රියා
3. කෘදන්ත
4. නිපාත

18. මුලින් දී ඇති පදයට සමානාර්ථවත් පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
1. විශාල - විපුල, මහත්, නැඹුළු, සුළු
2. නෙළුම් - පද්ම, අරවින්ද, සරෝජ, ශාක්‍ය
3. මැදුර - මන්දිරය, ආලය, ගෘහය, විමානය
4. උතුම් - උදාර, උත්තම, පවර, පළමු

19. පහත සඳහන් පද යුගල අතුරින් විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ කුමක්ද?
1. සුසිරිත - දුසිරිත
2. රිසි - නොරිසි
3. දුර්ලභ - සුදුර්ලභ
4. ස්වාධීන - පරාධීන

20. නිපාත පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.
1. මෙන්, සේ, එව්, බඳු
2. අනේ, අයියෝ, අහෝ, අපෝ
3. තෙක්, තුරු, පටන්, දක්වා
4. එම්බල, දරුවනි, වහා, සෙද

21. උපසර්ග පදයක් යෙදී නැති වරණය කුමක් ද?
1. ප්‍රබල, උපරාජ, අනුහස්, අනුබල
2. අවසඳ, කුකව්, පිළිතුරු, දුර්ජන
3. අධිකරණ, විමල, නිකසල, උමග
4. නිකැලැල්, නිර්දෝෂී, අවගුණ, පරදේශ

22. තද්ධිත පද දෙකක් හා කෘදන්ත පද දෙකක් අන්තර්ගත වරණය තෝරන්න.
1. වරලස්, සෙල්මුවා, අරටු, මැරිණි
2. වාසනාවන්ත, දුබලතා, කුකව්, මුදුනත්
3. නටනු, මුදිතා, ඉසුරුමත්, ලියවිලි
4. නටනු, ගැයුම්, කරනා, සිසිලස්

23. ‘සැරදේ මහ රජ’ මෙහි සැරදේ යන්න,
    1. ආශිර්වාද ක්‍රියාවකි
    2. විධි ක්‍රියාවකි
    3. ආමන්ත්‍රණ පදයකි
    4. විශේෂණ පදයකි

24. ‘නලඹ’ ‘පන්නම්’ යන පද දෙක අයත් සන්ධි දක්වා ඇති පිළිතුර වන්නේ,
    1. පූර්වස්වර හා පූර්ව රූප සන්ධිය
    2. පරස්වර ලෝප හා ගාත්‍රාදේශ සන්ධිය
    3. පරස්වර ලෝප හා පූර්ව රූප සන්ධිය
    4. පූර්වස්වර ලෝප හා ස්වරාදේශ සන්ධිය

25. නිවැරදි විසන්ධිය දැක්වෙන පද යුගලය වන්නේ,
    1. නේවාසික + ආගාර , පරණ + අම්බලම
    2. වපර + ඇස , චරිත + අපදාන
    3. අවංක + උදාර , පර + උපදේශ
    4. නිරා + ආයාසයෙන් , භක්ති + ආදර

26. වැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.
    1. ‘ඓ’ යනු මිශ්‍ර ස්වරයකි.
    2. ‘ළ’ භාවිතයේ දැක්වෙනුයේ ‘ළු’ වශයෙනි.
    3. ‘ශ’ , ‘ෂ’ අක්ෂර දෙක සංස්කෘත තත්සම පදවල පමණක් යෙදේ.
    4. ස්වර අක්ෂර සමඟ ගයනුකිත්ත යෙදීමේදී කොම්බුව ලිවිය යුතුය.

27, 28 සඳහා වඩාත්ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

27. කරදරයක දී වඩාත් වාසි ලබා ගැනීම.
    1. කුනිස්සන්ට දැල් දැමීම.
    2. පනින රිලවුන්ට ඉනිමං බැඳීම.
    3. බොරදියේ මාළු බෑම.
    4. අතු කඩා මොර කෑම.

28. තනතුරට නොගැළපෙන වැඩ කිරීම.
    1. කටුස්සගෙ කරේ රත්තරන් බැඳීම.
    2. එපා වාහෙට හොදි බෙදීම.
    3. කණකොක් සුද පේන්නෙ ඉගිලෙන විටදි ලු.
    4. ලැජ්ජා නැතිකම මහ මුදලි කමටත් වඩා ලොකුයි ලු.

29, 30 සඳහා නිවැරදි පද යුගලය තෝරන්න.

29. A - ආරාමය - සංඝාවාසය
B - උතුම් - අධම
C - රුහිරු - ලේ
D - විශාල - පෘථුල

1. A හා C 2. A හා D 3. A හා B 4. B හා C

30. A - ශ්‍රී පාද අඩවිය - දෙයියන්ගෙ රට
B - යොත - බිලී මන්ද
C - පරම්පරාව - පුද්ගල නාමයකි
D - පාවහන් - පාද ජාලා

1. A හා D 2. A හා C 3. A හා B 4. C හා D

31. ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.
1. මා අවදි වෙද්දී ඔහු සිනාසුණේ ය.
2. නදී තොමෝ ගලා යති.
3. ගුරුතුමා දේශනය පවත්වති.
4. කාන්තාවක ගමට ගියා ය.

32. "උපාසිකාව පහන් දැල්වූවාය" යන වාක්‍යය කර්මකාරයට ලිවීමේ දී නිවැරදි වනුයේ,
1. උපාසිකාව විසින් පහන දල්වයි.
2. උපාසිකාව විසින් පහන දල්වනු ලබයි.
3. උපාසිකාව විසින් පහන දල්වන ලදී.
4. උපාසිකාව විසින් පහන දැල්වේ.

33. හිස්තැනට සුදුසු අනුපිළිවෙළ තෝරන්න.
1. _____ පාරේ දකුණින් යා යුතුය.
2. අද රැස්වීමට _____ පැමිණ නැත.
3. _____ අවංක වුවහොත් රට වැසියෝ ප්‍රශංසා කරති.
4. _____ චාරිකාවට සහභාගී නොවෙති' යි අම්මා කීවාය.

A. පදිකයන් B. පදිකයෝ
C. සේවකයෝ D. සේවකයන්
E. අපි F. අප
G. ඔවුහු H. ඔවුන්

1. A, D, C, F 2. A, D, F, H
3. A, C, E, G 4. B, C, F, H

34. අතීතයේ සමාජ ක්‍රමයේ කුල කේලම්කාරයා විසින් විවාහ යොජනා ගෙනායේ ය. මෙහි "කේලම්කාරයා" යනු,
1.පණිවිඩ කාරයා 2. මඟුල් කපුවා
3. දෙමාපියන් 4. නෑදෑයින්

35. පෙමතො ජායති සොකො, මහාසාර යන නාට්‍යයන්හි නිර්මාණකරුවා වන්නේ,
1. ලලිතා සරච්චන්ද්‍ර
2. හෙන්රි ජයසේන
3. එදිරිවීර සරච්චන්ද්‍ර
3. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්

36. ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
කන්නේ කරවලයි රට හාලේ බතට
බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට
යන්නේ කවදා ද මව්පියො දකින්නට

මෙම කවියෙන් කියැවෙන්නේ,
1. දුම්බර මිටියාවතේ දුෂ්කර භාවය
2. හේන් ගොවියාගේ දුෂ්කර තාවය
3. වී ගොවියාගේ දුෂ්කර තාවය
4. පතල් කම්කරුවාගේ දුෂ්කර තාවය

37 හා 38 ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථ දෙන වරණය තෝරන්න

37. "පුතු සෙනේ පිතු හද තුළ ම මිස නැත පුතුන් හද තුළ රඳන්නේ"
1. පුතුන්ට ඇති සෙනෙහස පියවරුන් තුළ පමණක් ඇති බව
2. පියවරුන් තුළ ඇති පුත්‍රස්නේහය පුතුන් තුළ නොමැති බව
3. දෙමාපිය සෙනෙහස දරුවන් නොහඳුනන බව
4. දෙමාපියට පමණක් සෙනෙහස උරුම බව

38. අනුරාධපුර යුගයේ දී ඉදි වූ කලා නිර්මාණ අතුරින් සඳකඩ පහණ නිර්මාණ කරුවාගේ කලා කුසලතාවය මෙන් ම නිපුණතාවය ද පෙන්නුම් කරයි.
1. සඳකඩ පහණ කලා කරුවාගේ කුසලතා පෙන්වයි.
2. සඳකඩ පහණ විශිෂ්ට නිර්මාණයකි.
3. සඳකඩ පහණ තුළින් කලා කරුවාගේ නිපුණතාව ද පෙන්වයි.
4. අනුරාධපුර සඳකඩ පහණ කුසලතා පිරි කලා නිර්මාණයකි.

39. 'විස්මයෝත්ඵුල්ල නයනයන්' යන්නට නිවැරදි අර්ථ විවරණ සපයන්න.
1. පුදුමයෙන් පිරී ගිය ඇස්
2. විශාල වූ ඇස්
3. බියෙන් තැති ගත් ඇස්
4. මහත් වූ වටකුරු ඇස්

40. විරාම ලකුණු නිවැරදි ව යෙදී ඇති වාක්‍යය තෝරන්න.
1. "කට වහපන්, කට වහපන් කොහොමත් බබුන් ගියේ අවුරුද්දට ඉස්සර වෙලා
2. 'මුඛ එව, ඔඛ යව, යුද්ධ කරව පමා නොවව"
3. මහණෙනි මපුතුන් වැන්නවුන්ට භයෙක් කොයින් ද
4. 4 – 3 අනුපාතයට ගන්න.

**MINISTRY OF EDUCATION**

අධ්‍යාපන අමාත්‍යාංශය

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

අ.පොෂ.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

**SINHALA**

සිංහල

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

ePathshala The National e-learning Portal for The General Education

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - II**

**අ.පොෂ. (සා / පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. (අ) පහත සඳහන් අන්තස්ථාක්ෂරයන්හි ඇතුළත් ස්වර ලියන්න.

ය-

ල-

(ආ) පහත සඳහන් සඤ්ඤක අක්ෂර නිර්මාණය වන්නට බලපෑ නාසික්‍ය අක්ෂර ලියන්න.

ඟ-

ඳ-

II. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එය තෝරා නිදොස් කොට ලියන්න.

නගරෝද්‍යානයේ සෞන්දර්යය නැරඹූ කාන්තාවන්ගේ නෙත් සිත් ප්‍රහෝදවත් විය.

III. පහත සඳහන් පද විසන්ධි කොට ලියා ඒවා අයත් සන්ධි වර්ගය ලියන්න.

(අ) මොහොර (ආ) නියංසාය

IV. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

(අ) චිරන්තන (ආ) ප්‍රඥාව

V. පහත සඳහන් පද්‍ය පාඨයෙහි කළු අකුරින් දක්වා ඇති පද කවර ව්‍යාකරණ අංගයකට අයත් දැයි ලියන්න.

"හන්තානට පායන සඳ ලස්සනයි ද <u>කියන්න</u>
මා නොදුටුව ඒ <u>පුරහඳ</u> ඔබට හැකිය දකින්න"

VI. පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) සියලු කලාවන්ට අයිති දෙවඟන

(ආ) යහපත් මිත්‍රයා

VII. පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් සමාස පදයක් හා කෘදන්ත පදයක් ලියන්න.

මව්පියන් ඉදිරියේ ඇය රැඟුම් පෑවා ය.

VIII. පහත සඳහන් වචන අතර නොගැළපීමක් ඇත.එය ගැළපෙන සේ නැවත සකස් කර ලියන්න.

(අ) බුදු රශ්මිය (ආ) උද්‍යාන බිම

IX. පහත සඳහන් වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.

පොලීසිය සොරුන් ලුහු බඳිති.

නීතිඥයෝ ගැහැනියක කැඳෙව්වෝය.

X. පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාර සඳහා භාවිත වන පොදු ව්‍යවහාර ලියන්න.

(අ) පනිත්තලයා (ආ) ගැදැල්ල ගෑම

2. පහත සඳහන් (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර ඇසුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩුවන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාවේ ස්වාභාවික වන ගහණය දිනෙන් දින අඩු වෙමින් පවතී. අසංවිධිත ආකාරයෙන් මිනිසා පරිසරය පරිහරණය කිරීම මෙයට හේතුව යි. එය සියලු සත්ව ප්‍රජාවගේ ජීවිතවලට තදින්ම බලපෑම් සිදු කරයි.

(ආ) අන්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට බලවත් පහරක් එල්ල විය. අතීත උරුමයන් දැක බලා ගැනීමටත්, ස්වභාව සෞන්දර්යය විඳ ගැනීමටත් බොහෝ සංචාරකයෝ මෙරටට පැමිණෙති. රටේ දළ ජාතික නිෂ්පාදිතයෙන් වැඩි ආදයමක් සංචාරක ව්‍යාපාරය මගින් උපයන බැවින් සංචාරකයන්ගේ හෙට දවස සුරක්ෂිත කළ යුතු ය.

(ඉ) අතීතයේ මෙරට තිබූ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය සෑම අතින් ම වාසිදායක විය. ගොවියාගේ ආර්ථිකය මේ ක්‍රමය යටතේ ශක්තිමත් වූ අතර විධිමත් ආහාර රටාවක් එදා තිබුණි. අද ස්වයංපෝෂිත ක්‍රමයෙන් මිදී අවිධිමත් ආහාර රටාවක් පවත්වා ගෙන යන බැවින් බෝ නොවන රෝග ඇතිවීමේ අවදානම වැඩිව ඇත.

(ඊ) වර්තමානයේ අන් කවරදාකට වත් වඩා තාක්ෂණික මෙවලම් භාවිත කරයි. එහි යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵල වර්තමානය වන විට අපිත් අත් විඳිමින් සිටින්නෙමු. එබැවින් තාක්ෂණික මෙවලම් මානව සමාජයේ යහපත උදෙසා යොදා ගත යුතු ය.

3. පහත දැක්වෙන පාඨය වචන 55-65 අතර වන සේ සාරාංශ කරන්න.

අධ්‍යාපන ක්‍රියාවලිය පෙරට වඩා බෙහෙවින් සංකීර්ණ වී ඇත. අධ්‍යාපනයේ අරමුණු වෙනස් වී ඇත. අධ්‍යාපනයට සම්බන්ධ වන ගුරු ශිෂ්‍ය ජනගහනය බෙහෙවින් ම වැඩි වී ඇත. එසේ ම නව දැනුම් සම්භාරයක් විශාල වශයෙන් ලොව පුරා ප්‍රචලිතව ඇත. සෑම වසර හතරකට හෝ තුනකට වරක් ලොව පවතින නව දැනුම දෙගුණ තෙගුණ වේ. එසේ ම අධ්‍යාපන ලාභීන්ට වැඩි වේගයකින් හා ප්‍රමාණයකින් නව දැනුම උකහා ගැනීමට සිදු ව ඇත.

වර්තමාන ලෝකයෙහි අධ්‍යාපනය ලබන්නන් වේගයෙන් වෙනස්වන දැනුම ලබා ගැනීමේ අභියෝගයට මුහුණ දී සිටී. එම අභියෝග ජයගන්නට පරිගණකය, පරිලෝකන යන්ත්‍ර, සුහුරු පුවරු, සංයුක්ත තැටි ආදී තාක්ෂණික මෙවලම් බොහෝ උපකාරී වන බව කිව යුතු ය.

එමෙන් ම බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය මගින් ඉතා කුඩාවට දකින රූප සහ චලන දර්ශන විශාල ව දැකීමේ හැකියාව ඇති හෙයින් හා එය පන්ති කාමරයට නැවුම් අත්දැකීමක් එක් කරන නිසා එය වත්මන් පන්ති කාමරය තුළ ආකර්ෂණය වෙමින් පවතී. මෙසේ නවීන මෙවලම් භාවිත කිරීම තුළින් ගුරුවරයාට මෙන් ම ශිෂ්‍යයා ද අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ක්‍රියාශීලීව දායක වනු ඇත. මෙසේ දැනුම පුපුරා යන ලොවක නවීන තාක්ෂණය තුළින් දැනුම් සම්භාරයක් ලබා ගත හැකි වන අතර ම නව ලෝකයට ගැළපෙන පුරවැසියා නිර්මාණය කර ගැනීමට හැකි වනු ඇත. මේ අනුව බලන විට පවතින ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංශෝධනය විය යුතු ය. නැති නම් දැනුම පුපුරා යන ලොවක අප අසරණ වීමට ඉඩ ඇත.

4. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ඡන්දස සම්බන්ධයෙන් ලියැවුණු පැරණි ම පොත පිංගල ආචාර්යගේ වෘත්ත රත්නාකරයයි. ඔහු ඔහුගේ ඡන්දස ශාස්ත්‍රය නම් ග්‍රන්ථයේ මෙසේ පවසයි. "අක්ඛර නියමෝ ඡන්දස්" කවියක අක්ෂර නියම කිරීම ඡන්දස් බව ඉන් කියැවේ. තව දුරටත් එය පැහැදිලි කළහොත් පදයක අක්ෂරයන්ගේ හෝ මාත්‍රාවන්ගේ හෝ අක්ෂර ගණයන්ගේ සංඛ්‍යා නියමය වශයෙන් දැක්විය හැකි ය. සිංහලයේ සම්මතයට අනුව මාත්‍රා ඡන්දස හා ගණ ඡන්දස නමින් ඡන්දස දෙවර්ගයකි. ගණ ඡන්දස: වර්ණ ඡන්දස හා අක්ෂර ඡන්දං ලෙස සමහරු හඳුන්වති. ඇසිපිය හෙළන්නට ගත වන සුළු කාලය මාත්‍රාවක් ලෙස හැඳින්විය හැකි අතර එබඳු සුළු කාලයකින් උච්චාරණය කළ හැකි හ්‍රස්ම අකුරක් එක මාත්‍රාවක් වෙයි. එය ලුහු නමින් හැඳින්වෙන අතර උච්චාරණයේ දී මාත්‍රා දෙකක් වශයෙන් ගන්නා හ්‍රස්මය ගුරු වශයෙන් සැලකේ.

1. ඡන්දස යනු කුමක්ද?
2. ඡන්දස සම්බන්ධයෙන් ලිය වී ඇති ග්‍රන්ථය නම් කරන්න.
3. උච්චාරණයේ දී ගතවන්නේ මාත්‍රාවක් නම් එය හඳුන්වන්නේ කෙසේ ද?
4. සිංහලයේ ඡන්දස් ප්‍රභේද දෙක නම් කරන්න.
5. මෙම ඡේදයේ ඇතුළත් රකාරාංශය සහිත වචන දෙකක් ලියන්න.

(ලකුණු 10)

5. ඔබ ප්‍රදේශයේ මාර්ගය දෙපස හා ජල මූලාශ්‍ර වෙත ප්ලාස්ටික්, පොලිතින් වැනි නොදිරන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඇති බවත් ඒවා ප්‍රතිචක්‍රීය කිරීමට අවශ්‍ය උපකරණයක් ලබා දීම තුළින් මේ මහා පරිසර හානිය වළකාගත හැකි බවත් මේ සඳහා තම නගරාසන්න ගමක් වන හිඟුරක්ගොඩ කිරිමැටියාන ගමෙහි ම පුද්ගලයෙකු යෙදවිය හැකි බවත් පැහැදිලි කරමින් පොලිතින්, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීය කළ හැකි උපකරණයක් ඉල්ලා ඔබ ග්‍රාම සංවර්ධන සමිතියේ සම්පත් බණ්ඩාර ලේකම්වරයා යැයි සිතා ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමාට යවන ලිපිය සකස් කරන්න.

(ලකුණු 15)

නැතහොත්

ඔබ විසින් අලුතින් ආරම්භ කරන ලද සුවඳ විලවුන් හා ආලේපන වර්ග ඇතුළත් වෙළඳසලක් පිළිබඳ ප්‍රචාරක දැන්වීමක් වශයෙන් පුවත්පතක පළ කිරීම සඳහා සුදුසු වෙළඳ දැන්වීමක් සකස් කරන්න. එය ආකර්ෂණීය විය යුතු අතර ස්වභාවික නිෂ්පාදන බවත් මිල පහසු බවත් අවධාරණය කරමින් කලාත්මක භාවයෙන් යුක්ත වෙළඳ දැන්වීමක් සකසන්න.

(ලකුණු 15)

සැකසුම-අමරා විජේසිංහ මිය

# MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

## G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පොෂ.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

## SINHALA

සිංහල

# QUESTION PAPER - III

# ප්‍රශ්න පත්‍රය - III



අනුග්‍රහය :

## අධ්‍යාපන අමාත්‍යාංශය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

## අ.පොෂ. (සා / පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6 , 7 යන ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (1) සිට (10) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

1. යස දිගත ඇන්දේ
   විජය සිරි සඳ ගෙන වැලැන්දේ
   (අ) මෙහි දිසාවන්හි ඇන්දේ කුමක් ද?
   (ආ) මෙහි දැක්වෙන කාව්‍යාලංකාරය දක්වන්න.

2. ‘‘කිම්ද දරුයෙනි‘‘
   ‘‘මෙහි <u>ඇසෙන දෙයක්</u> ඇත.‘‘
   (අ) මෙම සංවාදය උපුටා ගත් කතාවේ නම ලියන්න.
   (ආ) මෙහි ඉරි ඇඳි පදය වර්තමාන ලේඛන ව්‍යාවහාරයට හරවා ලියන්න.

3. (අ) සිංහබාහු නාට්‍යයේ කතා සාරය උපුටාගත් කෘතිය කුමක් ද?
   (ආ) නාට්‍යයේ නිර්මාණකරුවා කවුද?

4. රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
   පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
   .....
   .....
   (අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
   (ආ) මෙම පද්‍යයෙහි ඇතුළත් දාර්ශනික කාව්‍ය සංකල්පනාව කුමක් ද?

5. ‘‘ වර්ෂාවක් වැස පායන්නාක් මෙන් කතාබහ ද කාලයක් සමඟ තුරුල් වී යන්නට විය.’’
   (අ) ඉහත පාඨය උපුටා ගත් පාඩමේ නම කුමක් ද ?
   (ආ) මෙහි ඇතුළත් රූඪී පදය ලියන්න.

6. කුළින් කුළම සිහිල’ඹ වැහෙන කදුරුය
   දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
   පළින් පළම තල් පොල් ගෙවතු මැදුරුය
   තළින් තළම පුල් පියුමු’පුල පඬරුය
   (අ) මෙම පද්‍යය උපුටා ගත්තේ කිනම් ග්‍රන්ථයෙන් ද?
   (ආ) මෙහි ‘පළින් පළම’ ,‘තළින් තළම’ යන පදවලට අර්ථ විවරණය සපයන්න.

7. ''මාගේ ශිල්පය දක්නා කැමති නියා වනැයි''
   (අ) මෙසේ සිතුවේ කවුද?
   (ආ) මෙම කතාවට පදනම් වූ මූලාශ්‍රය කුමක් ද?

8. දහසක් වැව් බැඳි යෝද මිනිස් කැල
   යොළි ඉපදී ඇති මවු දෙරණේ
   සත් රුවනින් නව නිදහන් මතු වී
   පුතුගෙ සිනාවෙනි ඔප වටුණේ
   (අ) කවියා ආර්ථික ශක්තිය සටහන් කළ කවි පදය උපුටා ලියන්න.
   (ආ) 'දහසක් වැව්' , 'යෝධ මිනිස්' යන පදවල ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දෙන්න.

9. (අ) මහින්ද හිමි විසින් ලියන ලද ජාතිකාභිමානී කෘති දෙකක් නම් කරන්න.
   (ආ) උන් වහන්සේ විසින් රචිත ළමා පද්‍ය නිර්මාණ දෙකක් ලියන්න.

10. ''යහපත් නැකතකින් වහා නික්මුණ මැනව''
    (අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?
    (ආ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය ලියවුණ සාහිත්‍ය යුගය කුමක් ද?

02. පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

1. එන්නේ කොහි සිට ද කොතනකට ද යන්නේ
   ඔබ කුමකට ද මා දුටු තැන් විමසන්නේ
   මිනිසුන් ගිහින් නිතර ම ආපසු එ න් නේ
   කිම දැයි කියා කිසිවෙකු ඇයි? නො සොය න්නේ

   (අ) ඉහත පද්‍යයෙන් කවියා ව්‍යාංග්‍යාර්ථවත් කළේ කුමක් ද?
   (ආ) මෙහි සඳහන් ජනකාව්‍ය ලක්ෂණයක් පෙන්වා දෙන්න.

2. ''ඒ විද්දත් දුවගේ භාව භාව ලීලා දැක වායෝධාත්වාධික රූප කලාප විකාරයක් බලවත් නියා ය යි නොසිතා''

   (අ) බලවත් වූ ප්‍රේමය ඇති වූයේ කා වෙනුවෙන් ද ?
   (ආ) ඉහත පාඨය ලිහිල් බසින් ලියන්න.

3. පවන ද පිපි තු රේ ය නිර තුරේ ය
   කුසුමන් පෙති තු රේ ය මළු තුරේ ය
   අවට සුපිපි සි රේය බිඟු සරේ ය
   සිත එවෙහෙර කෙ රේ ය ලොබ කෙරේ ය

   (අ) මිනිසුන්ගේ සිත ආශා කළේ කිනම් වස්තුවකට ද ?
   (ආ) 'අවට සුපිපි සිරේය බිඟු සරේය' යන්න ලිහිල් බසින් ලියන්න.

4. 'හොඳයි මං ඔයාට දෙන්නම් ප්‍රැන්කු හාරසියයක් ලස්සන ඇඳුමක් ගන්න උත්සාහ කරල බලන්න.'

   (අ) මෙම ප්‍රකාශය කරන්නේ කාට ද?
   (ආ) මෙම ප්‍රකාශය කරන පුද්ගලයා තුළ දක්නට ලැබෙන ගුණාංගය කුමක් ද?

5. 'ඔය දෑල දොඩමලු ය සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම්ද
කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන
සොඳුර නුඹ වාගේ ම හිනැහේය මා එක්ක'

(අ) 'ඔය දෑල දොඩමලුය' යන්නෙන් ව්‍යංග්‍යාර්ථවත් කරන්නේ කුමක් ද?
(ආ) කවියා සොඳුර උපමා කරන්නේ කුමකට ද? එහි උපමා උපමේය වෙන් කර පෙන්වන්න.

03. (1) මහෞෂධ පණ්ඩිතයන්ගේ ස්ථානෝචිත ප්‍රඥාවත්
(2) කේවට්ට බමුණාගේ ආත්මාර්ථකාමී බවත්
උම්මග්ග ජාතක කතාකරුවා නිරූපණය කර ඇත්තේ කෙසේ දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 15)

නැතහොත්

(1) ජන කවියේ ඇති අව්‍යාජත්වයත්
(2) කුරහන් ගොවියා මුහුණ දෙන අභියෝගත් කුරහන් ඉසිමුව කළුවර බලාලා යන පද්‍ය නිර්මාණය ඇසුරින් විමසන්න. (ලකුණු 15)

04. (1) සත්ව චර්යා

(2) මානව චර්යා

ඇසුරින් ගුත්තිල කවියා වීණා වාදනයේ මිහිරියාව පෙන්වූයේ සජීවී දසුන් මවාලමිනි. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

නැතහොත්

(1) අවස්ථා නිරූපණයක්
(2) චරිත නිරූපණයක්

ඇසුරෙන් උග්ගසේන තරුණයා ජීවිත අභියෝග ජයගත් ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 15)

05. බැද්දේගම නවකතාවේ රසවත් භාවයට කතුවරයා යොදා ගත් භාෂාව හේතු වූ බව උදාහරණ තුනක් වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. 'මුනි සිරිපා සිඹිමින්නේ යන පද්‍ය නිර්මාණය රසවත් වන්නේ කවියා යොදා ගත් කාව්‍යෝපක්‍රම හේතුවෙනි.' නියමිත කොටසින් උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. 'සිහින ලෝකයක ජීවත් වීම බොහෝ ව්‍යසනයන්ට හේතුවන බව' දියමන්ති මාලය නම් කෙටිකතා ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 10)